වැසි වනාන්තර සුරකින්නෝ

http://www.RainforestProtectors.org
RainforestProtectors@Gmail.com
දු.අ. 0773486568

26.12.2013

කේ.පී. ආරියදාස, අධිකාරී ජනරාල් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිකාර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ඉංගිරිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

## ඉංගිරිය හොර ගස් රක්ෂිතයට අදාල වර්තමාන තර්ජන

ඉංගිරිය හොර ගස් රක්ෂිතයේ වර්තමාන තර්ජන පිලිබඳව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම මෙම ලිපියේ අරමුණයි.

**ඡායා රූප 1:** ඉංගිරිය හොර ගස් රක්ෂිතයේ ජයටම දඩමස් ජාවාරම ගෙන යන බවට, අපට වාර්තා වී ඇත. වල් ඌරන්, මීමින්නන් හා ඉත්තෑවන් වැනි සතුන් දඩයම් කරන මොවුන් අනවසරයෙන් කැලෑව මැදින් දඩයම් මාර්ගයක් සාදාගෙන ඇති බව මෙම ඡායා රූපයෙන් දැක ගත හැකිය.



**ඡායා රූප 2:** සමහර වනාන්තර මායිම් කණු වලට හානි වී ඇත.



**ඡායා රූප 3:** බටුගම්පොල පාර අද්දර වනාන්තරය අවසන් වන මායිමෙහි සමහර මායිම් කණු සම්පූර්ණයෙන් අතුරුදහන් වී ඇත. මේ අවට වනාන්තරය එළිපෙහෙලි කර ඇති බව අපට දැක ගත හැකි විය.



**ඡායා රූප 4:** වනාන්තරයට පැමිණෙන සංචාරකයන් හට කියවීමට දමා ඇති දැන්වීම් පුවරුව මල බැඳී අබලන් තත්වයක පවතී.




මෙම කරුණු සම්බන්දයෙන් කඩිනම් පියවර ගනු මෙන් වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් බැගෑපත්ව අප ඉල්ලා සිටින අතර, අපගේ සහය වුවමනා නම් කාරුණිකව දැනුම් දෙන මෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි

ශ්‍රියන්ත පෙරේරා

ජයන්ත විජේසිංහ